**පාදෙණිය අනුරාධපුර මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

පාදෙණිය අනුරාධපුර මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා කොරියා අපනයන හා ආනයන බැංකුව අතර 2008 දෙසැම්බර් 19 දින එළඹි අංක ශ්‍රී 18 දරන ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම වාර්තාවේ දැක්වෙන මාගේ අදහස් සහ ප්‍රකාශන පාර්ලිමේන්තුවේ වාර්තා කළ යුතුය.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සහ මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (අ) ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රයේ පිහිටා ඇති පාදෙණිය - අනුරාධපුර මාර්ගය අතර මාර්ග කොටස වැඩිදියුණු කිරීම මගින් ප්‍රදේශ අතර භාණ්ඩ හුවමාරුව හා මහජන සම්බන්ධතා ක්‍රියාත්මක කිරීමට මෙන්ම ජාතික ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ සමාජ පිරිවැය කපාහැරීම සහ කර්මාන්ත තරඟකාරිත්වය ඉහළ නැංවීම මගින් ප්‍රාදේශීය සංවර්ධනය සමතුලිත කිරීම සහ (ආ) කටුනායක - පාදෙණිය මාර්ග කොටසට මාර්ගය සම්බන්ධ කිරීමටද සැලසුම් කිරීමයි. එසේම කටුනායක පිහිටි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ සංස්කෘතික උරුමයන්ගෙන් හා සංචාරක ආකර්ෂණයෙන් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත අතර මඟී ප්‍රවාහන පහසුකම් ඇති කරලීම මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි ජාත්‍යන්තර තරඟකාරිත්වය ශක්තිමත් කිරීමටද අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 10,902.90 කට සමාන ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 81.73 ක් වූ අතර ඉන් රු.මිලියන 8,786.93 කට සමාන ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 66.32 ක් සැපයීමට කොරියානු අපනයන සහ ආනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,115.97 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කරනු ඇතැයි අපෙක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2009 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර 2012 ජනවාරි 01 දින වන විට නිම කර තිබුණි. කෙසේ වුවත් මෙම ව්‍යාපෘතිය නිම කිරීම 2012 නොවැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වා ගණනය කළ මතය.

---

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය මගින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

## 2. භෞතික කාර්යසාධනය.

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.

මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත 2012 නොවැම්බර් 30 දින භාර දී තිබුණි. කෙසේ වුවත් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල ගැටළු හේතුවෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ මෙහෙයුම් කටයුතු 2018 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව පවත්වාගෙන තිබුණි.

### 2.2 මතභේදයට තුඩු දෙන කරුණු.

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ව්‍යාපෘතියේ සියළු කටයුතු සම්පූර්ණ කර භාර දී තිබුණද ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට උපදෙස් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන විසින් ලබා දී නොතිබුණි. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ මෙහෙයුම් විශේෂ අරමුණකින් තොරව ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා සමහර ගෙවීම් ඇති බැවින්, එම ගෙවීම් අවසන් වන තුරු ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය අඛණ්ඩව පවත්වාගෙන යා යුතුව තිබේ. | ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අඩුකිරීමට ඉඩම් අත්පත් කර ගැනීමේ වගකීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරිය යුතුය. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබූ විශේෂ අත්තිකාරම් මුදල් රු.මිලියන 11.28 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | ක්‍රියාත්මක කරන ආයතන සමඟ පැවති නොපියවූ ශේෂ අඛණ්ඩව ගිණුම්වල දැක්වීම. | අත්තිකාරම පියවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණි. | ශේෂ පියවීම සඳහා ගිණුම්වලට ගැළපීම් සිදුකළ යුතුය. |